මාධ්‍ය නිවේදනය

**කාර්මික නිෂ්පාදන දර්ශකය (IIP) - 2024 මැයි මාසය**

**පදනම් වර්ෂය - 2015**


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

**හැඳින්වීම**

කාර්මික නිෂ්පාදන දර්ශකය (IIP) මඟින් මාසයක කාලපරිච්ඡේදයක් සඳහා ශ්‍රී ලංකාවේ කාර්මික අංශයේ නිෂ්පාදන තත්ත්වය සාරාංශගතව නිරූපණය කරයි. එහි ප්‍රධාන අරමුණ වන්නේ රටේ නිෂ්පාදන අංශයෙහි කාර්මික නිෂ්පාදනයේ පරිමාවේ කෙටි කාලීන වෙනස්කම් පිළිබඳ මිනුමක් ලබා දීමයි. කාර්මික කාර්ය සාධනය මැන බැලීමට සහ අනාගත ආර්ථික කාර්ය සාධනය පුරෝකථනය කිරීමට මෙම දර්ශකය මඟින් තොරතුරු සපයයි. මෙම දර්ශකය කර්මාන්ත අංශයේ අතීත වර්ධනයන් සංස්ෂිප්තව දැක්වීම, අනාගත ප්‍රවණතා පුරෝකථනය කිරීමට පහසුකම් සැපයීම සහ සාක්ෂි පදනම් කරගත් ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා සහාය වේ. කාර්මික නිෂ්පාදනය ආර්ථිකයේ වඩාත් ගතික සහ උච්චාවචනය වන අංශයක් වන බැවින් ආර්ථික වෙනස්කම් විශ්ලේෂණය කිරීම සඳහා කාර්මික නිෂ්පාදන දර්ශකය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

අන්තර්ජාතික කර්මාන්ත වර්ගීකරණය (ISIC-REV-04) අනුව කාර්මික නිෂ්පාදනය සඳහා අදාළ වන ආර්ථික කටයුතු ප්‍රධාන අංශ 20 ක් යටතේ වර්ගීකරණය කර මාසිකව එම අංශයන්හි කාර්මික නිෂ්පාදනයේ හැසිරීම මිනුම් කිරීම මෙහිදී සිදු කරනු ලබයි. පදනම් වර්ෂය ලෙස 2015 වසර යොදාගැනෙන අතර 2015 වර්ෂයෙහි එක් එක් කාර්මික අංශයෙහි වාර්ෂික සාමාන්‍ය නිෂ්පාදන පරිමාව 100 ලෙස ගෙන එයට සාපේක්ෂව මාසිකව මෙම කාර්මික නිෂ්පාදන දර්ශකය ගණනය කරනු ලැබේ.

ප්‍රස්තාරය 1: කාර්මික නිෂ්පාදන දර්ශකය (IIP) -මැයි (2016-2024)




මූලාශ්‍රය: කාර්මික නිෂ්පාදන දර්ශකය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


**කාර්මික නිෂ්පාදන දර්ශකය 2024 මැයි මාසය -විශේෂ කරුණු**

- **2024 මැයි මාසය සඳහා කාර්මික නිෂ්පාදන දර්ශකයේ අගය 93.9 කි.**
- **2024 මැයි මාසය සඳහා කාර්මික නිෂ්පාදන පරිමාව 2023 වසරේ මැයි මාසයට සාපේක්ෂව 6.8% කින් වර්ධනය වී ඇත. 2023 මැයි මාසයේ දී කාර්මික නිෂ්පාදන දර්ශකයේ අගය 88.0 කි.**
- **2024 මැයි මාසයේ දී විවිධ නිෂ්පාදන අංශයන් අතරෙන් "ගෘහ භාණ්ඩ හැර දැව, දැව නිෂ්පාදන හා ලීයෙන් කරන ලද නිෂ්පාදන, පිදුරු වලින් කරන ලද ද්‍රව්‍ය හා ගොතන ලද ද්‍රව්‍ය (92.1%)" සාපේක්ෂව ඉහළ වර්ධනයක් පෙන්නුම් කරන අතර "යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නිෂ්පාදනය (19.4%)" සාපේක්ෂව ඉහළ පසුබෑමක් පෙන්නුම් කරයි.**

**කාලීනව ගැළපූ මාසික කාර්මික නිෂ්පාදන දර්ශක අගයන්හි ප්‍රතිශත වෙනස්වීම**

සළකා බලනු ලබන මාසයත් සමඟින් පසුගිය මාස 12 සඳහා මාසික දර්ශක අගයන්හි චල සාමාන්‍ය (12MMA) ඇගයීම හරහා මෙම ප්‍රතිශත වෙනස ගණනය කෙරේ. කාලීන විචලනය ඉවත් කරමින් පවතින චක්‍රීය ප්‍රවණතාවය ව්‍යුත්පන්න කිරීම චල සාමාන්‍ය ගණනය මඟින් සිදු කරනු ලැබේ. එය දර්ශකයන්හි වාර්ෂික සාමාන්‍ය ලෙසද සැළකිය හැකිය. මෙම දර්ශකය භාවිතා කිරීමෙන් රටේ නිෂ්පාදන පරිමාවෙහි මාසික වර්ධනය (ප්‍රවණතාවය) පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගත හැකිය.

ප්‍රස්තාරය 2: චල සාමාන්‍ය දර්ශක අගයන් (මාස 12 සඳහා ගලපන ලද)-2023 ජනවාරි සිට 2024 මැයි දක්වා




මූලාශ්‍රය: කාර්මික නිෂ්පාදන දර්ශකය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**විශේෂ කරුණු**

- **2024 මැයි මාසය සඳහා කාර්මික නිෂ්පාදන දර්ශකයෙහි චල සාමාන්‍ය අගය 91.0 කි.**
- **2024 අප්‍රේල් මාසය සඳහා කාර්මික නිෂ්පාදන දර්ශකයෙහි චල සාමාන්‍ය අගය 90.5 කි.**
- **චල සාමාන්‍ය අගයන් අනුව පරිමාවේ මාසික වෙනස සලකන විට, එය 2024 අප්‍රේල් මාසයට සාපේක්ෂව 2024 මැයි මාසයේදී චල සාමාන්‍ය අගය 0.5% * කින් වර්ධනය වී ඇත.**
- **ප්‍රධාන නිෂ්පාදන අංශ අතරින් "විදුලි උපකරණ නිෂ්පාදනය (5.4%)" මෙම වර්ධනය සඳහා සාපේක්ෂව ඉහළ දායකත්වයක් දක්වා ඇත.**

2024 මැයි මාසයට අදාළ කාර්මික නිෂ්පාදන දර්ශකය පිළිබඳ විස්තරාත්මක තොරතුරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කර ඇත.

http://www.statistics.gov.lk/Industry/StaticalInformation/IndexIndustrialProduction

**දැක්ම**

"දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම."

**මෙහෙවර**

"ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මඟින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම."

ජනලේඛන හා
සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
"සංඛ්‍යාන මන්දිරය"
306/71,
පොල් දූව පාර,
බත්තරමුල්ල.

info@statistics.gov.lk
+94 11 2147000
+94 11 2147400
+94 11 2147011
www.statistics.gov.lk

**කර්මාන්ත ඉදිකිරීම් වෙළඳ හා සේවා අංශය මඟින් මෙම ප්‍රකාශනය සකස් කරන ලදී**

5 වන මහල , ජනලේඛන හා
සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
Industries@statistics.gov.lk
+94 11-2147401
+94 11-2147412